ශ්‍රී ලංකා ජනාධිපති

இலங்கை சனாதிபதி

**President of Sri Lanka**

## නිදහස් දින පණිවුඩය

ජාතික නිදහසෙහි ඇති අගය වටහා ගැනීමට නම් පරාධීනත්වය ඇතිකරන අවමානය ද පීඩනය ද වටහාගත යුතුය. රටේ නිදහස උදෙසා ප්‍රාණ පූජාවෙන් යුතුව කැපවූ අපේ අතීත විරුවන්ට අප සදා ණයගැතිවන්නේ එබැවිනි. නිදහසෙහි අගය ගැන සිහිකරන අද වන් දිනක, ශ්‍රී ලංකාව විජය භූමියක් කිරීමට කැපවූ, සැබෑ පරිත්‍යාගශීලීන් වූ ඔවුන් සියලු දෙනා වෙත සමස්ත ජාතියේ උත්තමාචාරය පුද කරන්නේ හද පිරි බැතියෙනි.

ශ්‍රී ලංකාව ස්වාධීන ජාතියක් ලෙස නිදහසේ දශක හතක් සපුරන මේ මොහොත, අප විසින් පසුගිය කාලයේදී අත්පත් කරගත් සාධනීය වර්ධනයන් සහ ජයග්‍රහණ පිළිබඳව ගැඹුරින් ආවර්ජනය කිරීමට සුදුසුම අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. එකී කාල පරාසය තුළ අප නියත වශයෙන්ම සපුරා ගතයුතුව තිබූ මානව සංවර්ධන ඉලක්ක සහ මුහුණ දිය යුතුව තිබූ සමාජ, ආර්ථික, දේශපාලන සහ ජන ජීවිතයේ ආරක්ෂාව සම්බන්ධ අභියෝග පිළිබඳව සලකා බැලීමේදී අපි ගිරිදුර්ග රැසක්ම සාර්ථක ලෙස තරණය කර ඇත්තෙමු.

ස්වදේශීය අනන්‍යතාවයෙන් ඔප්නැංවුන ජාතියක් ලෙස අපට ඕනෑම අභියෝගයක් ඉදිරියේ නැගී සිටිය හැකිය. ඒ බව අප අපගේ සමස්ත ඉතිහාසය තුළ මැනවින් ප්‍රදර්ශනය කර තිබේ. ශ්‍රී ලංකාව යනු යුහුසුළුව නැගී සිටිය හැකි රටක් බව මේ මොහොතේදී අප නැවතත් සනාථ කළයුතුව තිබේ. ඒ සඳහා අප විසින් දියත් කළ යුතු සංග්‍රාම ගණනාවක් ඇති බව ද මෙහිදී සිහිපත් කළයුතුය. සැමට සම අවස්ථා හිමිවන හරිත සංවර්ධනයක් කරා යොමුවීම ද, ඒ තුළ ජාතික සංහිඳියාව සාක්ෂාත් කර ගැනීම ද අපගේ මානව සම්පත ගෝලීය වශයෙන් ඉහළ ගුණාත්මක සහ තරඟකාරී මට්ටමකට ගෙනඒම ද අපගේ ප්‍රමුඛ අවධානය යොමුවිය යුතු ඉලක්ක වන්නේය.

ඒ සමඟම, අප මැනවින් අවබෝධ කරගත යුතු සත්‍යයක් වන්නේ සැබෑ නිදහස යනු දේශපාලන නිදහස පමණක්ම නොවන බවයි. නිදහස පරිපූර්ණ වීමට නම් යම් ජාතියක ආර්ථික නිදහස හා සංස්කෘතික නිදහස ද තහවුරු වියයුතු බව පිළිගත යුතු යථාර්ථයකි. ආර්ථික නිදහස කරා අප යන ගමන පිළිබඳව සැලකීමේදී මේ වර්ෂය අපට ඉතා වැදගත් වනු ඇත.

රටක් ලෙස අප අතීතයේදී මෙන්ම අනාගතයේදී ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව, අපගේ දිගු කාලීන ඉලක්ක සමග බැඳී සිටීම අපගේ සාර්ථකත්වයයි. මොරගහකන්ද ජලාශය නිම කිරීමත් සමග මහවැලි ව්‍යාපාර සාර්ථකව නිමකිරීමට හැකිවීම ඊට සාක්ෂි දරයි. එමෙන්ම මේ වර්ෂය "ජාතික ආහාර නිෂ්පාදන වර්ෂය" ලෙස නම් කරනු ලැබුවේ අප ජාතිය දශක හතක් තිස්සේ දුටු සිහිනයක් වන ආහාර සුරක්ෂිතතාව සාක්ෂාත් කරගැනීමට ය.

නිදහස ලබා දශක හතක් සපිරෙන මේ අභිමානවත් අවස්ථාවේ රට වෙනුවෙන් ඉටුකළ යුතුව ඇති සියලු වගකීම් නොපිරිහෙලා ඉටුකරන බව සපථ කරන අතරම ජාතියක් ලෙස අපේ සැබෑ ශක්තිය නම් අපගේ සමගිය සහ අධිෂ්ඨානය බව අවධාරණය කරනු කැමැත්තෙමි.

මෛත්‍රීපාල සිරිසේන

2018 පෙබරවාරි මස 04 වන දින

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு

Democratic Socialist Republic of Sri Lanka